## 21. ශීර්ෂ 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය

## 21.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452(1) | පවත්වා නොතිබුණි. |
| රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය | පවත්වා නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එන් 20 ආකෘතිය | පවත්වා නොතිබුණි. |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශ | පවත්වා නොතිබුණි. |
| කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අත් පොතෙහි 2.11.3 | පවත්වා නොතිබුණි. |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අත් පොතෙහි 5.2.1 | පවත්වා නොතිබුණි. |

## 21.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට සහ ඉකුත් වර්ෂයේදී නිකුත් කළ විගණන විමසුමකට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 21.3 විසර්ජන ගිණුම

### 21.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 96 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 21.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 21.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 21.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 21.4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 21.4.4 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

### 21.5 බේරුම් නොකළ බැරකම්

කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු බේරුම් නොකළ බැරකම් රු.1,259,883 ක් විය.

### 21.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 (1) | 441,809 | වැය විෂයන් 02 කට සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 (3) | 111,580 | වාහන අනතුරු සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යුතු අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104 (4) | 1,038,364 | අලාභය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ්/437 දරන චක්‍රලේඛයේ 3 ඡේදය | 706,332 | රාජ්‍ය අංශයට අයත් සියලුම ආයතන තම ආයතනයට අවශ්‍ය වන සියලුම රක්ෂණ ආවරණයන් සෘජුවම ජාතික රක්ෂණ භාර |

| | | | |
|---|---|---|---|
| | | | අරමුදලෙන් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ලබා ගත යුතු වුවත් කාර්යාලය විසින් වාහන රක්ෂණයේදී රක්ෂණ නියෝජිතයෙකුගේ සේවය ලබා ගෙන තිබුණි. |
| **(ඇ)** | **මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** | | |
| (i) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 1/2010/01 දරන චක්‍රලේඛයේ 6 ඡේදය | 277,724 | විදේශ අධ්‍යයන චාරිකා සඳහා අනියම් හා සංයුක්ත දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| (ii) | 9 (iii) උප ඡේදය | 231,437 | විදේශ ගමනකදී ලබා ගත් දීමනාවලින් හිමිකම් නොලබන දීමනා ආපසු ගෙවා නොතිබුණි. |

## 21.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන රාජ්‍ය වියදම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව තනතුර අනුව හිමිවිය යුතු වාහන ගණන 03 ක් වුවත්, වාහන 06 ක් එම තනතුර සඳහා අනුයුක්ත කර තිබුණි. ඊට අමතරව කුලී පදනම මත වාහන ලබා ගැනීම සඳහා අවස්ථා 04 කදී රු.103,460 ක් වැය කර තිබුණි.

## 21.8 අවිධිමත් ගනුදෙනු

කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

කාර්යාල අවශ්‍යතාවයන් සඳහා අළුත් අවුරුදු සුභ පැතුම් පත් 10,500 ක් හා වෙසක් සුභ පැතුම් පත් 22,000 ක් මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන අනුගමනය නොකර එක් ආයතනයක් විසින් එවා තිබුණු මිල ගණන් පදනම් කර ගෙන එකතුව රු.1,673,350 ක් වැය කර එම ආයතනයෙන් මිලදී ගෙන තිබුණි.

## 21.9 අනාර්ථික ගනුදෙනු

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව අරපිරිමැසුම්දායි නොවන වාහන හඳුනා නොගෙන ලියාපදිංචි කර වසර 10 කට වඩා පැරණි වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා පසුගිය වර්ෂවලද අධික වියදම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේද ඒ සඳහා රු.1,114,320 ක වියදමක් කර තිබුණි.

## 21.10 විසඳා නොතිබුණු විගණන ඡේද

----------------------------------

කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2013 | 1.6 (අ)(i) | නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව විදේශ ගත වූ නිලධාරිනියකට විදේශ ගතවූ කාලයට අදාලව සම්පූර්ණ වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| | 1.6 (අ) (iv) | පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |
| | 1.6 (අ) (iv) | නිලධාරිනිය විදේශ ගතවී සිටි කාලය මසකට වැඩි වුවද විදේශ ගත වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |
| | 1.6 (අ) (iv) | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි. |
| | 1.6 (අ) (v) | විදේශ ගතවීමේදී අනියම් හා සංයුක්ත දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| | 1.6 (අ) (vi) | විපක්ෂ නායක කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ඇස්තමේන්තු අගය ඉක්මවා ගෙවීම් කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| | 1.6 (අ) (vii) | මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කර නොතිබුණි. |
| | 1.7 (i) | නිල වාහන හිමි නිලධාරීන් සඳහාද රැස්වීම් පැවැත්වෙන දින වලදී ප්‍රවාහන දුෂ්කරතා මත ගෙවන රු.750 ක දීමනාව ගෙවා තිබුණි. |

| | |
|---|---|
| 1.7 (ii) | වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව අවස්ථා හතරකදී වැටුප් වර්ධක 10 ක් ලබා දී තිබුණි. |
| 1.7 (iii) | විපක්ෂ නායක කාර්යාලය අලුත් වැඩියා කිරීමේ කුලී ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව අවස්ථා 4 කදී රු.3,150,000 ක් ගෙවා තිබුණි. |

## 21.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 06 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 21 | 21 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 16 | 01 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 10 | 10 | - |
| | **එකතුව** | **62** | **55** | **07** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 07 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.